# සාධාරණ සමාජයක් සඳහා වන ජාතික ව්‍යාපාරය
# நீதியான சமுதாயத்திற்கான தேசிய இயக்கம்
# National Movement for Social Justice

අංක 74, කිරුළපන ඇවනිව්, කොළඹ 05
இல 74, கிரலப்பனை அவென்யூ, கொழும்பு 05
No 74, Kirulapone Avenue, Colombo 05

0112512992 /0777751092 /0778021761
nmsjoffice2023@gmail.com




මාධ්‍ය නිවේදනය | Press Release | ஊடக வெளியீடு | 2024/07/12

## දුම්රිය වැඩවර්ජනය අවසන් කිරීම සඳහා ගෞරවාන්විත ප්‍රවේශයකට යොමු වූ සියළුම පාර්ශවයන් වෙත ස්තුතිය පළ කරන්නෙමු.

දුම්රිය ස්ථානාධිපතිවරුන් විසින් ගෙන ගිය වෘත්තීය අරගලය ගෞරවාන්විත විසඳුමක් කරා ප්‍රවේශ කරවීම සඳහා සාධාරණ සමාජයක් සඳහා වන ජාතික ව්‍යාපාරය කරන ලද ඉල්ලීම පිළිගැනීම ගැන අදාල සියළුම පාර්ශවයන් වෙත අපි අපගේ ස්තුතිය පිරිනමන්නෙමු.

දින දෙකක් පුරා ඇදී යමින් පැවති දුම්රිය ස්ථානාධිපතිවරුන්ගේ වැඩ වර්ජනය අවසන් කරමින් ගෞරවාන්විත විසඳුමකට ප්‍රවේශ වන ලෙස අප සංවිධානයේ ගරු සභාපති ශ්‍රී ලංකාභිමාන්‍ය කරු ජයසූරිය මැතිතුමා අදාල සියළු පාර්ශ්වයන් වෙත ආරාධනා කරන ලදි. ඒ අනුව දුම්රිය ස්ථානාධිපතිවරුන්ගේ සංගමයේ සභාපති සුමේධ සෝමරත්න මහතා ඇතුළු නියෝජිත පිරිසක් සහ ප්‍රවාහන අමාත්‍ය ගරු බන්දුල ගුණවර්ධන හා ප්‍රවාහන රාජ්‍ය අමාත්‍ය ගරු ලසන්ත අලගියවන්න මහත්වරුන් ඇතුළු දෙපාර්ශවයම කරු ජයසූරිය මහතාගේ නිවසට රැස්ව දෙපාර්ශවයටම ගෞරවාන්විත ලෙස ප්‍රවේශ විය හැකි විසඳුමක් පිළිඳව සාකච්ඡා කරන ලදි.

ඒ අනුව ජුනි 11 වන දා රාත්‍රියේ සිට දුම්රිය ස්ථානාධිපතිවරුන්ගේ වැඩවර්ජනය අවසන් කරමින් එකඟත්වයකට පැමිණීමට හැකි වූ අතර තවමත් නොවිසඳුණු ප්‍රශ්න ගණනාවකට ද සාධාරණ හා ගෞරවාන්විත ප්‍රවේශයකට යොමුවීම සඳහා දෙපාර්ශවයම එකඟත්වයක් ඇතිකර ගන්නා ලදි.

මෙම එළැඹුම ඉතාමත් අගය කරන අප සංවිධානය එය මේ රටේ අනෙකුත් වෘත්තීය සමිති හා සටන් මධ්‍යස්ථානයන් හි අවධානයට ලක් වේවායයි ප්‍රාර්ථනා කරන්නෙමු.

එමෙන් ම ගෞරවාන්විතව සාකච්ඡා මාර්ගයෙන් ප්‍රශ්න විසඳාගැනීම සඳහා ප්‍රවේශවීම පිළිබඳව ගරු ප්‍රවාහන අමාත්‍යතුමාට, ගරු රාජ්‍ය අමාත්‍යතුමාට සහ දුම්රිය ස්ථානාධිපතිවරුන්ගේ සංගමයේ සභාපති ඇතුළු සියළුම දෙනා වෙත සාධාරණ සමජයක් සඳහා වන ජාතික ව්‍යාපාරය ලෙස අපි අපගේ ස්තුතිය පිරිනමන්නෙමු.

**සුනිල් ජයසේකර**
මහලේකම්
සාධාරණ සමාජයක් සඳහා වන ජාතික ව්‍යාපරය
2024.07.12